පිරිසක් සමග අනුරාධපුර බන්ධනාගාරයට බීමතින් ඇතුළත් වූ රාජ්‍ය ඇමතිවරයෙකු එහිදී අතිශයින්ම නොමනා අයුරින් හැසිරුණු බවට වන චෝදනාවක්, සැප්තැම්බර් 15 අරුණ සහ ලංකාදීප පුවත්පත් වාර්තාවන් ඔස්සේ දක්නට ලැබිණි. කෙසේ වෙතත්, මේ සම්බන්ධ පුවත් වාර්තාවක් ඉදිරිපත් කරනා සැප්තැම්බර් 15 දින The Morning පුවත්පත ප්‍රකාශ කර තිබුණේ, රාජ්‍ය ඇමති ලොහාන් රත්වත්තේට එසේ හැසිරුණු බවට චෝදනා එල්ල වී ඇති බවයි.

මෙසේ, එකම පුවත වාර්තා කරනා සිංහල භාෂා පුවත්පත් දෙකක්, අදාළ රාජ්‍ය ඇමතිවරයා කවුරුන්ද යන්න හෙළිදරවු නොකරන අතර, එයම වාර්තා කර සිටින ඉංග්‍රීසි භාෂා පුවත්පත ඇමතිවරයාගේ නම හෙළිදරවු කරයි. මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #TheMorning #Lankadeepa #Aruna**